සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

## B කොටස - රචනා

**උපදෙස් :**

- ✻ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ✻ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **150** කි.)

**5.** (i) පාංශු සෞඛ්‍ය හා තිරසර බව වැඩිදියුණු කිරීමේ දී ජෛව පොහොරවල කාර්යභාරය විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා කන්න දෙක සහ වර්ෂාපතන රටාව පදනම් වූ ඍතු හතර අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(iii) ප්‍රධාන පාංශු සංඝටක නම් කර බෝග ඵලදායිතාවයට ඒවායේ ඇති බලපෑම පැහැදිලි කරන්න.

**6.** (i) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා සමූපකාර සමාගම්වල වැදගත්කම විස්තර කරන්න.

(ii) උචිත රූප සටහන් භාවිතයෙන් සූක්ෂම ක්‍රමයට කිරි ගවයින් පාලනයට සුදුසු විවිධ නිවාස ආකාර විස්තර කරන්න.

(iii) බෑවුම් සහිත භූමියක් බෝග නිෂ්පාදනය කිරීම සඳහා සැකසීමේ දී අනුගමනය කරනු ලබන වැදගත් පිළිවෙත් විස්තර කරන්න.

**7.** (i) ඝන ආස්තරණ නිවාසයක බිත්තර දමන කිකිළියන් රැළක් රැක බලාගැනීම හා සම්බන්ධ ප්‍රධාන පාලන ක්‍රියා විස්තර කරන්න.

(ii) බිංදු සහ විසිරි ජලසම්පාදන පද්ධති ඒවායේ වාසි සහ අවාසි හුවා දක්වමින් සංසන්දනය කරන්න.

(iii) බෝග ශාකවල උත්ස්වේදනය පාලනය කිරීමේ අවශ්‍යතාවය සහ උත්ස්වේදනය පාලනය කරන ක්‍රම විස්තර කරන්න.

**8.** (i) බීජ ජීව්‍යතාවයට බලපාන සාධක විස්තර කරන්න.

(ii) නිර්පාංශු වගාව සඳහා මාධ්‍යයන් තේරීමේ දී සලකා බැලිය යුතු සාධක විස්තර කරන්න.

(iii) ආක්‍රමණශීලී වල්පැළ ව්‍යාප්ත වන ක්‍රම සහ බෝග නිෂ්පාදනයට ඒවායේ බලපෑම විස්තර කරන්න.

**9.** (i) ශාකවල රෝග රහිත බව, සුළු වශයෙන් රෝග පැවතීම සහ බරපතල ලෙස රෝග පැවතීම යන තත්වයන් රෝග ත්‍රිකෝණය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ පළතුරු සහ එළවළුවල පසු අස්වනු හානිවලට බලපාන සාධක විස්තර කරන්න.

(iii) ගොවියාගේ ආදායම වැඩි කිරීමට කෘෂි කර්මාන්තයේ අගය දාම විශ්ලේෂණය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**10.** (i) මානව පෝෂණයේ දී කාබෝහයිඩ්‍රේට, සහ ප්‍රෝටීන වල කාර්යභාරය විස්තර කරන්න.

(ii) මිශ්‍ර බෝග වගා පද්ධතියක් සඳහා බෝග තේරීමේ දී සලකා බැලිය යුතු ලක්ෂණ විස්තර කරන්න.

(iii) කෘෂි ව්‍යාපාර කළමනාකරණයේ පියවර **හතර** විස්තර කරන්න.

✻✻✻